**PAUL RATNAYEKE ASSOCIATES**
ATTORNEYS-AT-LAW
COLOMBO

<u>කොළඹ දිසා අධිකරණයේ දී ය.</u>

නිහාල් ශ්‍රී අමරසේකර
167/4, ශ්‍රී විපුලසේන මාවත
කොළඹ 10.

<u>පැමිණිලිකරු.</u>

නඩු අංකය: <u>21819/එම්ආර්.</u>

– එදිරිව –

1. ගාමිණී ලක්ෂ්මන් පීරිස්
'විසුම්පාය' ස්ටේප්ල්ස් වීදිය
කොළඹ 2 සහ
37, කිරුළ පෙදෙස
කොළඹ 05.

2. හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්
කළම්බු හිල්ටන් ස්පෝර්ට්ස් කම්ප්ලෙක්ස් බාරේ
එව්ලන් චතුරශ්‍රය
ලෝටස් පාර,
කොළඹ 01.

<u>විත්තිකරුවෝ.</u>

1999 මැයි මස 21 වන දින දී ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු කටයුතු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයින් වන පෝල් රත්නායක ආසෝසියේට්ස් යන නාමධාරී විලාසයෙන් හවුල් ව්‍යාපාර කටයුතු කරන ජේම්ස් හෙන්රි පෝල් රත්නායක, උස්වත්ත ලියනගේ සුදත් නිලුපුල් ප්‍රසංග පෙරේරා සහ පුන්‍යකාන්ති නවරත්න හා ඔවුන්ගේ සහායකයින් වන ශලින්ද්‍ර ජයසිංහ, ඉන්ද්‍රලෝජිනී රාජගෝපාලන්, චන්ද්‍රානි සූරියආරච්චි, අමාලි දීපානි අලවිච, රුචිරා ඇන්තනි, සුරේනි වීරසිංහ, වඩුගේ ඉරේෂා උපුලි ප්‍රනාන්දු, චාමලි වීරසේකර, ශාන්ත හේවාකොස්ගොඩගේ, ගාමිණී බාලසූරිය සහ රොෂානි රුද්‍රිගෝ යන නීතිඥවරුන් මගින් පෙනී පෙනී සිටින ඉහත නම සඳහන් 1 වන විත්තිකරුගේ විරෝධතා ප්‍රකාශයෙන් මෙසේ ප්‍රකාශ වේ:–

01. ලේඛන සොයා ගැනීම සඳහා නියම කරන ලද දැන්වීම අපැහැදිලි වූ සහ/හෝ විෂය පථය අති විශාල වූ සහ/හෝ සිවිල් නඩු විධාන සංග්‍රහයේ 102 වන වගන්තියට අනුකූල නොවූ එකක් බව 1 වන විත්තිකරු ප්‍රකාශ කරයි.

02. මෙම පරිවේෂණ යටතේ, මේ නඩුවේ කාර්ය සඳහා මේ ඉල්ලීම සද්භාවයෙන් නොකරන ලද්දක් බව 1 වන විත්තිකරු ප්‍රකාශ කරයි.

03. කෙසේ වුව ද, මුදල් අමාත්‍යාංශයේ ඇති ලේඛන ගරු මුදල් අමාත්‍යවරයාගේ සන්තකයේ සහ බලය යටතේ පවතින බවත් පැවති බවත් 1 වන විත්තිකරු ප්‍රකාශ කරයි.

04. කෙසේ වුව ද, ඉහත සඳහන් ප්‍රකාශවලට අගතියකින් තොරව, 1 වන විත්තිකරු මෙසේ ප්‍රකාශ කරයි:

(1) මුදල් අමාත්‍යාංශයේ ඇති ලේඛන, සාමාන්‍යයෙන් ම රහස්‍ය ස්වභාවයේ වූ සහ/හෝ සංවේදනීය ස්වභාවයේ වූ ඒවා ය.

(ii) එවැනි ලේඛන එළිදරව් කිරීමෙන් මහජන යහපතට හානියක් සිදු විය හැකි අතර මහජන යහපතට පටහැනි විය හැකි ය.

05. කෙසේ වුව ද, සොයා ගැනීම සඳහා ඉල්ලීම කරන ලද්දේ ද ආඥාව ලබා ගෙන ඇත්තේ ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ 103 වන වගන්තියේ විධිවිධාන මගහැරමට බව 1 වන විත්තිකරු ප්‍රකාශ කරයි.

06. කෙසේ වුව ද, (සොයා ගැනීමට අපේක්ෂිත) ලේඛන මේ නඩුවේ මතු කොට ඇති සිද්ධි කරුණුවලට අදාළ වන බව සහ/හෝ ප්‍රමාණවත් ලෙස වැදගත් වන බව ස්ථුට කිරීමට සහ/හෝ බැලූ බැල්මට පෙන්වා දීමට පවා පැමිණිලිකරු අපොහොසත් වී ඇති බව 1 වන විත්තිකරු ප්‍රකාශ කරයි.

07. සොයා ගැනීම සඳහා කර ඇති ඉල්ලීම අඳුරේ අතපත ගෑමක ස්වභාවයේ එකක් බව 1 වන විත්තිකරු ප්‍රකාශ කරයි.

08. නිකුත් කරන ලදැයි කියනු ලබන 1999 මැයි මස 4 වන දින දරන දැන්වීම ප්‍රමාද දෝෂයකින් නිකුත් කරන ලද්දක් බව සහ/හෝ කරන ලද කවර වුව ද ආඥාවක් ප්‍රමාද දෝෂයකින් කරන ලද්දක් බව 1 වන විත්තිකරු වැඩිදුරටත් ප්‍රකාශ කරයි.

09. කෙසේ වුව ද, ඉහත සඳහන් ප්‍රකාශවලට අගතියකින් තොරව, එකී දැන්වීමේ විස්තර කොට ඇති සහ/හෝ සඳහන් කොට ඇති ලේඛන, බැලූ බැල්මට, (ඒ දැන්වීමේ මුහුණතෙහි දැක්වෙන ආකාරයට) 1 වන විත්තිකරුගේ පෞද්ගලික තත්ත්වයෙන් 1 වන විත්තිකරුගේ සන්තකයේ තිබිය නොහැකි ඒවා බව 1 වන විත්තිකරු ප්‍රකාශ කරයි.

10. කෙසේ වුව ද, දැන්වීමෙහි දක්වා ඇති පරිදි ලේඛන සොයා ගැනීමට, දැන්වීමේ මුහුණතෙහි පෙනෙන පරිදි, පැමිණිලිකරුට හිමිකම නොමැති බව, ඉහත සඳහන් ප්‍රකාශවලට අගතියකින් තොරව, 1 වන විත්තිකරු ප්‍රකාශ කරයි.

11. කෙසේ වුව ද, දැන්වීමෙහි දක්වා ඇති පරිදි, සොයා ගැනීම සඳහා ආඥාවක් නීතියට අනුව නොකළ හැකි ය.

12. මේ පරිවේෂණ යටතේ, මේ නඩුවේ කාර්ය සඳහා මේ ඉල්ලීම සද්භාවයෙන් නොකරන ලද්දක් බව 1 වන විත්තිකරු ප්‍රකාශ කරයි.

13. වඩාත් සවිස්තරාත්මකව මෙහි අඩංගු ප්‍රකාශ සනාථ කිරීම සඳහා වූ 1 වන විත්තිකරුගේ දිවුරුම් ප්‍රකාශය මීට අමුණා ඇත.

එමනිසා 1 වන විත්තිකරු අයැද සිටින්නේ:-

(අ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 102 වන වගන්තිය යටතේ කර ඇති පැමිණිලිකරුගේ උද්දේශිත ඉල්ලීම නිෂ්ප්‍රභ කරන ලෙස සහ/හෝ ඊට ඉඩ නොදෙන ලෙස;

(ආ) නඩු ගාස්තු ප්‍රදානය කරන ලෙස; සහ

(ඇ) සුදුසුයයි මේ අධිකරණයට පෙනී යන වෙනත් සහ වැඩිදුර සහන ප්‍රදානය කරන ලෙස ය.

<u>සකස් කරන ලද්දේ:</u>

නීතිඥ එස්. හර්ෂ අමරසේකර
ජනාධිපති නීතිඥ ජේ. රොමේෂ් ද සිල්වා

Paul Ratnayeke Associates
1 වන විත්තිකරුගේ ලේඛනගත නීතිඥවරු

**PAUL RATNAYEKE ASSOCIATES**
ATTORNEYS-AT-LAW
COLOMBO

<u>කොළඹ දිසා අධිකරණයේදී ය</u>

නිහාල් ශ්‍රී අමරසේකර
167/4, ශ්‍රී විපුලසේන මාවත
කොළඹ 10.

<u>පැමිණිලිකරු.</u>

නඩු අංකය:<u>21819/එම්ආර්</u>

– එදිරිව –

1. ගාමිණී ලක්ෂ්මන් පීරිස්
'විසුම්පාය', ස්ටෙප්ලීස් විදිය
කොළඹ 2 සහ
37, කිරුල පෙදෙස
කොළඹ 05.

2. හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්
කළම්බු හිල්ටන් ස්පෝට්ස් කම්ප්ලෙක්ස් බාරේ
එච්ලන් චතුරශ්‍රය
ලෝටස් පාර,
කොළඹ 01.

<u>විත්තිකරුවෝ.</u>

කොළඹ 5, කිරුල පාරේ අංක 37 දරන ස්ථානයේ පදිංචි ගාමිණී ලක්ෂ්මන් පීරිස් වන මම බෞද්ධාගමිකාරයකු වශයෙන් මෙහි පහත දැක්වෙන කාරණා ගම්භිරතා පූර්වකවත්, අවංකවත්, සත්‍ය ලෙසත් සහතික කොට ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමි:–

01. මෙහි ඉහත නම සඳහන් සහතික ප්‍රකාශක මම වෙමි.

02. ලේඛන සොයා ගැනීම සඳහා නියම කරන ලද දැන්වීම අපැහැදිලි වූ සහ/හෝ විෂය පථය අති විශාල වූ සහ/හෝ සිවිල් නඩු විධාන සංග්‍රහයේ 102 වන වගන්තියට අනුකූල නොවූ එකක් බවට මට උපදෙස් ලැබී ඇති බැවින් මම එසේ ප්‍රකාශ කර සිටිමි.

03. මෙම පරිච්ඡේදය යටතේ, මේ නඩුවේ කාර්ය සඳහා මේ ඉල්ලීම සද්භාවයෙන් නොකරන ලද්දක් බවට ද මට උපදෙස් ලැබී ඇති බැවින් මම එසේ ප්‍රකාශ කර සිටිමි.

04. කෙසේ වුව ද, මුදල් අමාත්‍යාංශයේ ඇති ලේඛන ගරු මුදල් අමාත්‍යවරයාගේ සන්තකයේ සහ බලය යටතේ පවතින බවත් පැවති බවත් මම ප්‍රකාශ කර සිටිමි.

05. කෙසේ වුව ද, ඉහත සඳහන් ප්‍රකාශවලට අගතියකින් තොරව, මෙසේ ප්‍රකාශ කර සිටිමි:

( I ) මුදල් අමාත්‍යාංශයේ ඇති ලේඛන, සාමාන්‍යයෙන් ම රහස්‍ය ස්වභාවයේ වූ සහ/හෝ සංවේදනීය ස්වභාවයේ වූ ඒවා ය.

( I ) එවැනි ලේඛන එළිදරව් කිරීමෙන් මහජන යහපතට හානියක් සිදු විය හැකි අතර මහජන යහපතට පටහැනි විය හැකි ය.

06. කෙසේ වුව ද, සොයා ගැනීම සඳහා ඉල්ලීම කරන ලද්දේ ද ආඥාව ලබා ගෙන ඇත්තේ ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ 103 වන වගන්තියේ විධිවිධාන මගහැරීමට බව මට උපදෙස් ලැබී ඇති බැවින් මම එසේ ප්‍රකාශ කර සිටිමි.

07. කෙසේ වුව ද (සොයා ගැනීමට අපේක්ෂිත) ලේඛන මේ නඩුවේ මතු කොට ඇති සිද්ධි කරුණුවලට අදාළ වන බව සහ/හෝ ප්‍රමාණවත් ලෙස වැදගත් වන බව ස්ථුට කිරීමට සහ/හෝ බැලූ බැල්මට පෙන්වා දීමට පවා පැමිණිලිකරු අපොහොසත් වී ඇති බවට මට උපදෙස් ලැබී ඇති බැවින් මම එසේ ප්‍රකාශ කර සිටිමි.

08. සොයා ගැනීම සඳහා කර ඇති ඉල්ලීම අඳුරේ අතපත ගෑමක ස්වභාවයේ එකක් බව මම ප්‍රකාශ කරමි.

09. නිකුත් කරන ලදැයි කියනු ලබන 1999 මැයි මස 4 වන දින දරන දැන්වීම ප්‍රමාද දෝෂයකින් නිකුත් කරන ලද්දක් බව සහ/හෝ කරන ලද කවර වුව ද ආඥාවක් ප්‍රමාද දෝෂයකින් කරන ලද්දක් බවට මට උපදෙස් ලැබී ඇති බැවින් මම වැඩිදුරටත් එසේ ප්‍රකාශ කරමි.

10. කෙසේ වුව ද, ඉහත සඳහන් ප්‍රකාශවලට අගතියකින් තොරව, එකී දැන්වීමේ විස්තර කොට ඇති සහ/හෝ සඳහන් කොට ඇති ලේඛන, බැලූ බැල්මට, (ඒ දැන්වීමේ මුහුණතෙහි දැක්වෙන ආකාරයට) 1 වන විත්තිකරුගේ පෞද්ගලික තත්ත්වයෙන් මගේ සන්තකයේ තිබිය නොහැකි ඒවා බවට මට උපදෙස් ලැබී ඇති බැවින් මම එසේ ප්‍රකාශ කරමි.

11. කෙසේ වුව ද, දැන්වීමෙහි දක්වා ඇති පරිදි ලේඛන සොයා ගැනීමට, දැන්වීමේ මුහුණතෙහි පෙනෙන පරිදි, පැමිණිලිකරුට හිමිකම නොමැති බව මට උපදෙස් ලැබී ඇති බැවින් ඉහත සඳහන් ප්‍රකාශවලට අගතියකින් තොරව මම එසේ ප්‍රකාශ කරමි.

12. කෙසේ වුව ද දැන්වීමෙහි දක්වා ඇති පරිදි, සොයා ගැනීම සඳහා ආඥාවක් නීතියට අනුව කළ නොහැකි ය.

13. මේ පරිවේෂණ යටතේ, මේ නඩුවේ කාර්ය සඳහා මේ ඉල්ලීම සද්භාවයෙන් නොකරන ලද්දක් බවට ද මට උපදෙස් ලැබී ඇති බැවින් මම එසේ ප්‍රකාශ කර මි.

මෙහි ඉහත සඳහන් කරුණු කියවා )
තේරුම් ගෙන වර්ෂ 1999 ක්වූ )
මැයි මස 21 වන දින කොළඹදී )
ප්‍රතිඥා දී අත්සන් තබන ලදී.---)

Sgd.
මා ඉදිරිපිට දී ය.

Sgd.
සාමදාන විනිශ්චයකාර.